**නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 - 2024**

---

**1. විගණන මතය**

**1.1** නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 22 හි කාරක සභා 21 කට තත්ත්වාගණනය කළ මතයක්ද සහ එක් කාරක සභාවක මතය ව්‍යාවනය කිරීම ද සිදු කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතයන් හා මතය ව්‍යාවනය කිරීම සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ස්ථාවර වත්කම් වල පිරිවැය, වර්ෂයේ එකතු කිරීම්, බැහැර කිරීම, වාර්ෂික ක්ෂය සහ සමුච්චිත ක්ෂය ප්‍රතිපාදන සහ ශුද්ධ අගය වෙන් වෙන්ව දැක්වෙන පරිදි උපලේඛන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2025 වර්ෂයේ දී සකස් කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කර විධිමත් පරිදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 08 ක සමාලෝචිත වර්ෂයේ අක්කර බදු ආදායම මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි. | දෙපාර්තමේන්තුව ලබාදුන් ආකෘතියට අනුව සකස් කරන බව සහ ඉදිරි ගිණුම් වාර්තා නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. | උපචිත පදනම මත ගිණුම් සැකසීම කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05 ක, සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වියදම රු. 129,213 ක් අඩුවෙන් ගිණුම්ගත කර ඇති අතර ගොවිජන සේවා කාරක සභා 03 | ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | නිවැරදි ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය.. |

| | | | |
|---|---|---|---|
| | ක ක්ෂය වියදම රු. 72,428 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි . | | |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 17 ක කාරක සභාවට අයත් ඉඩම්වල හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම කළමනාකරණයේ උපදෙස් මත කිරීමට කටයුතු කරන බව. | කළමණාකරණ උපදෙස් කඩිනමින් ලබා ගෙන ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නිල්දණ්ඩාහින්න සහ කඳපොල ගොවිජන සේවා මධ්‍යස්ථාන වල 2023 වර්ෂයේ විගණන විමසුම් මත සමුච්චිත අරමුදලට ගැලපුම් කළ යුතු රු. 307,744 ක් ගැලපුම් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා විධිමත් පරිදි සමුච්චිත අරමුදලට ගැලපුම් කළ යුතුය. |
| (ඈ) | කරලියද්ද හා ගිණිගත්හේන ගොවිජන සේවා කාරක සභාවල සමාලෝචිත වර්ෂයට අදාළ ගොවිජන බැංකු ලාභාංශ එකතුව රු. 269,620 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගැලපීම් කළ යුතුය. |
| (ඉ) | මුංවත්ත ගොවිජන සේවා කාරක සභාවේ 2024 වර්ෂයේ රු.292,881 ක ස්ථාවර වත්කම් මිල දී ගැනීම ආරම්භක ශේෂයන් ලෙස හඳුනාගෙන තිබුණි. | ඉදිරියේදි මෙවැනි අතපසුවීම් නොවීමට කටයුතු කරන බව. | - එම - |
| (ඊ) | මුංවත්ත ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දේපල කුලියට දීම මගින් රු. 143,700 ක් වාර්ෂික ආදායම ලබන දේපල ස්ථාවර වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ හඳුනාගෙන නොතිබුණි. | දේපල ස්ථාවර වත්කමක් ලෙස ගිණුම් ගත කිරිමට ඉදිරියේදි කටයුතු කරන බව. | අදාළ ස්ථාවර වත්කම් වටිනාකම තක්සේරු කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | මුංවත්ත ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොවිජන බැංකුවෙන් ලැබිය යුතු රු. 579,180 ක ලාභාංශ ගොවි බැංකු මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු වටිනාකමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | දීර්ඝ දිමනා වෙන් කිරිම් යටතේ පෙන්වා ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගැලපීම් කළ යුතුය. |
| (ඌ) | ගොවිජන සේවා කාරක සභා 04 ක රු.184,800 ආපසු යැවුම් හා රු.240,700ක තොග අත්හැරීමක්ද රු.133,255 ක තොග අඩුවෙන් දැක්වීම් හා රු.111,120 ක අක්කර බදු ආදායම් වැඩියෙන් දැක්වීමක්ද පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (එ) | ගොවිජන සේවා කාරක සභා 15 ක උපයෝගි ලේඛන සහ මූල්‍ය ප්‍රකාශන අතර රු. 8,040,245 නොසැසදීම් නිරීක්ෂණය විය. | වැරදි නිවැරදි කර ගැනිමට කටයුතු කරන බව. | උපයෝගි ලේඛන සහ මූල්‍ය ප්‍රකාශන අතර වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.3 අවිනිශ්චිත ගිණුම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මන්දාරම්නුවර ගොවිජන සේවා කාරක සභාවේ රු.172,373 ක හර අවිනිශ්චිත ශේෂ නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීම සඳහා උපදෙස් ප්‍රධාන කාර්යාලය වෙතින් ඉල්ලා ඇති බව. | ශේෂ හඳුනාගෙන කඩිනමින් නිරවුල් කළ යුතුය. |

### 1.3.4 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 14 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු. 17,777,019 ක වත්කම් ශේෂ 120 ක හා එකතුව රු. 18,226,586ක වගකීම් ශේෂ 72 කට අදාල ස්ථාවර වත්කම් ලේඛන, උප ලේඛන, ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාෂණය කිරීමට නොහැකි විය. | අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගත යුතු අතර වත්කම් හා වගකීම් සනාථ, කිරීම සඳහා අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | නුවරඑළිය ගොවිජන සේවා කාරක සභාවේ රු. 20,052,160 ක වටිනාකමැති වවුචර් 23 ක් සඳහා ගෙවීම් තහවුරු කිරීමට අදාළ බිල්පත්, සාක්ෂි ලෙස ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී වවුචර් හා සම්බන්ධව කටයුතු කිරීමේදී සැලකිලිමත් වනලෙස කලමනාකරණ සභාකාරට උපදෙස් ලබා දී ඇති බව. | අදාළ බිල්පත් විගණනයට ඉදිරිපත් කිරීමටත්, අවිධිමත්ව කටයුතු කළ නිලධාරීන්ට පියවර ගැනීමත් කළ යුතුය. |

### 1.4. නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1982 අංක 43 දරන මුදල් පනතේ විධිවිධාන වලට හා 2008 ජනවාරි 01 දින නිකුත් කරන ලද 2006අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | රු.25, 000 ට වැඩි ගෙවීම් සඳහා රු. 25ක මුද්දර ගාස්තුවක් අය කළ යුතු වුවත්, රු.136,001,739ක වටිනාකමක් ඇති අවස්ථා 462 ක ගෙවීම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.11,550 ක මුද්දර ගාස්තු අය කරගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවල ද අදාළ මුද්දර ගාස්තු අයකරගෙන නොතිබුණි. | කළමනාකරණයේ උපදෙස් මත කිරීමට කටයුතු කරන බව. | කඩිනම් පියවර ගෙන පනත ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 22 ක වාර්ෂික කාර්යසාධන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 56 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 10 ක සමාලෝචිත වර්ෂයට අදාළ රු .350,620 ක හිඟ අක්කර බදු අයකර නොතිබුණි | ඉදිරි වර්ෂයේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර කාලීනව අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු. රෙ. 110 | ගොවිජන සේවා කාරක සභා 16 ක හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලේඛන සකස් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු අදාළ ලේඛන පවත්වා ගත යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ. | . | | |
| (i) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 21.2 ඡේදය. | තොග පොත් අඩු වශයෙන් දෙසතියකට වරක්වත් විධායක ලේකම්වරයා විසින් පරීක්ෂා කර ශේෂ නිවැරදි බවට සහතික කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 22 ක ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර එසේ නොකිරීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ii) | 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 දරන චක්‍රලේඛයේ 12 ඡේදය. | කාරක සභාවක දෛනික රඳවාගත හැකි අතැති මුදල් සීමාව ඉක්මවා අවස්ථා 474 ක දී රු.10,023 සිට රු.614,231 දක්වා අතැති මුදල් රඳවාගෙන තිබුණි. | සීමාවේ රැඳී සිටීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | - එම - |
| (iii) | 2000 ජූනි 06 දිනැති අංක 518/2000 දරන චක්‍රලේඛයේ 03 ඡේදය හා 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘති චක්‍රලේඛයේ 5.6 (i) ඡේදය. | කාරක සභා 22 හි ගොවිජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර නොතිබුණි. | අදාළ උපදෙස් ලබාදී නොතිබුණු බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 04/2012 (සංශෝධන VII) දරන චක්‍රලේඛයේ 2 වගන්තිය) | දෛනිකව අත රඳවා ගත හැකි රු.50,000 සීමාව ඉක්මවා ගොවිජන බැංකු 14 ක අවස්ථා 364 කදී රු.50,094 සිට රු.2,088,912 දක්වා මුදල් අත රඳවා ගෙන තිබුණි. | ඉදිරියේදී සීමාව නොඉක්මවීමට අදාල නිලධාරීන් දැනුවත් කළ බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (v) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන චක්‍රලේඛයේ 3.4.2 ඡේදය | කෘෂි කාර්මික ණය පියවීමේ උපරිම කාලය මාස 06 ක් වුවද, ගොවිජන සේවා කාරක සභා 05 ක ගොවීන් 329 දෙනෙකුට 1998 මහ කන්නයේ සිට 2023 යල කන්නය දක්වා කාලය තුළ නිකුත් කළ එකතුව රු.10,946,027 ක කෘෂි ණය අයකර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | කාලීනව ණය අය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතු අතර ණය ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය. |
| (vi) | 2023 දෙසැම්බර් 11 දිනැති අංක 12/2018 සංශෝධන 01 දරන චක්‍රලේඛයේ 2 ඡේදයේ i හා ii | වටිනාකම රු.100,000 ට වැඩි කම්වු පරිහරණ මිලදී ගැනීම් වෙනුවෙන් හා රු. 200,000 ට වැඩි නැවත විකිණීමේ පදනම මත මිලදී ගැනීම් වෙනුවෙන් ගෙවීම් සිදු කිරීමේදී ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්ගේ අනු අත්සන තැබිය යුතු වුවද, ගොවිජන සේවා කාරක සභාව 03 ක් මඟින් අවස්ථා 03 කදී රු.158,000 - රු.500,000 දක්වා ගෙවීම් සිදු කිරීමේදී එසේ අනු අත්සන ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතු අතර එසේ අනුකූල නොවූ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 19 ක ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (උ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 3.4 ඡේදය. | ගොවිජන සේවා කාරකසභා 14 ක රු.73,327,059 කෘෂි ද්‍රව්‍ය හා උපකරණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව මිලදී ගැනීම් සිදුකර තිබුණි. | 2023.10.25 දිනැති ගො.සං. කො. ජනරාල්ගේ ගො.සේවා. කාරක සභාව මුදල් පරිහරණය සම්බන්ධව නිකුත් කර ඇති ලිපිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු අතර අනුකූල නොවූ නිළධාරීන්ට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | | ප්‍රකාරව කටයුතු කර ඇති බව හා කළමනාකරණයේ උපදෙස් මත කිරීමට කටයුතු කරන බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 21 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ, එකතුව රු.6, 846,587ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව කාරක සභා 13 ක ඉකුත් වර්ෂයේ රු.3,538,827 ක අතිරික්තයක් ද ඊට ප්‍රතිරූපීව කාරක සභා 08 ක රු.813,166 ක ඌණතාවයක් ද විය. ගොවිජන සේවා කාරක සභාවක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.191,092 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව එම කාරක සභාවේ ඉකුත් වර්ෂයේ රු.143,750 ක ඌණතාවයක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති ගොවි බැංකු 22 හි මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය රු. 9,511,390 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 8,228,658 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මුදල් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ දැක්වීම** | **අදහස් නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් ජංගම ගිණුම්වලට අදාළ චෙක් පොත්වල හිස් චෙක්පත් 11 ක් අත්සන පමණක් යොදා කාර්යාලයේ රඳවා ගෙන තිබීමෙන් එම කාරක සභාවල අභ්‍යන්තර මූල්‍ය පාලනය දුර්වල මට්ටමක පැවතුණි. | චෙක්පත් අත්සන් කිරීමේ බලය ලබාදී ඇති නිලධාරීන් පෞද්ගලික අවශ්‍යතාවයන් මත ප්‍රදේශයෙන් බැහැරව සිටි බැවින් චෙක්පත් අත්සන් යොදා ලබාගෙන තිබුණු බව. | අභ්‍යන්තර මූල්‍ය පාලනය ශක්තිමත් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | විකුණුම් මුදල් ගෙවීමේ පදනම යටතේ ගොවිජන සේවා කාරක සභා 14 ක කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින් ගෙන් 2023 දෙසැම්බර් 31 වන විටත් අයවිය යුතු මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් රු.3,458,231 ක් අයකර ගෙන නොතිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව. | කාලීනව මුදල් නොගෙවන නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05 ක රු. 109,048 ක තොග කල් ඉකුත් වී තිබුණි. | ද්‍රව්‍යය ආපසු භාරදීමට කටයුතු කරන බව හා අපහරණය කිරීමට කටයුතු කරන බව. | අලෙවිකරණ කටයුතු විධිමත් කිරීමටත් කල් ඉකුත් වූ තොග විධිමත් පරිදි අපහරණය කිරීමත් කළ යුතුය. |
| (ආ) | කඳපොල ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් සංචාරක බංගලාවේ ඇතැම් නිලධාරීන් සහ පුද්ගලයින් සඳහා ගාස්තු අයකර ගැනීම් වලින් තොරව සහ නිලධාරීන්ගේ හැඳුණුම්කම් මත ගාස්තු අය නොකර කාමර කුලියට දී ඇති අවස්ථා 06ක් පැවතුණි. | දිස්ත්‍රික් කාර්යාලයේ උපදෙස් මත මෙම කාර්යයන් සිදුකරන බව. | සංචාරක බංගලාව වෙන්කිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමයක් මෙන්ම මාර්ගගත ක්‍රමයක් ස්ථාපිත කළ යුතු අතර හඳුනාගත් අවස්ථාවන්ට අදාළ අයවිය යුතු ගාස්තු වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගත යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 17 ක් පරිහරණය කරන ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය කාරක සභා වෙත පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීම් සිදු කර ගැනීමට ඉදිරියේදි කටයුතු කරන බව | වත්කම්වල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | මන්දාරම්නුවර කාරක සභාව විසින් භාවිතා කරමින් පැවති නගරය ආසන්නයේ වර්ග අඩි 250 ක පමණ වන ගොඩනැගිල්ලක් හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් වගා පනත යටතේ විදූලිපුර ගොවිජන සේවා කාරක සභාව වෙත පවරා දී ඇති අලුඔය ප්‍රදේශයේ පවතින අක්කර 2ක පමණ ඉඩම සහ ගොඩනැගිල්ල හා හෙල්බොඩ ගොවිජන සේවා කාරක සභාවට අයත් රම්බොඩගම වසමේ ඇති ඒ ශ්‍රේණියේ පර්චස් 3.5 කුඹුරු ඉඩමක බාහිර පාර්ශවයක් විසින් බලහත්කාරයෙන් භාවිතා කෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය. | අදාළ පාර්ශව දැනුවත් කර ඇති බව සහ ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය තහවුරු කර අදාළ දේපළ පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විදුලිපුර ගොවිජන සේවා කාරක සභාවට අයත් දික්ඔය නගරයේ පිහිටි කඩ කාමරයේ හා කරල්ලියද්ද ගොවිජන සේවා කාරක සභාවේ භුක්තියේ පවතින හිඟුරාකඩුව හා උඩවත්ත පොහොර ගබඩාවල අයිතිය කාරක සභා වලට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට ඉදිරියේ දී බලාපොරොත්තු වන බව. | අදාළ දේපළ විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරකසභා 22 හි කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරීන් සඳහා කෘෂි ද්‍රව්‍ය හා උපකරණ අලෙවි කිරීම සඳහා ලබා දී ඇති ඉලක්ක සපුරා ගැනීම අවම තත්ත්වයක පැවතුණි. | ඉදිරි වර්ෂය තුළ දී සියළු ඉලක්ක සම්පූර්ණ කරන ලෙසට නිලධාරීන් දැනුවත් කර ඇති බව. | විධිමත් අධීක්ෂණයක් හා පසු විපරම් සිදු කර නිලධාරීන් වෙතින් ඉලක්ක උපරිම ලෙස සපුරාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 07/05/12/ගි.වා/තා.ගො දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිපිය අනුව කටයුතු කර ගොවිජන සේවා කාරක සභා 12 ක දිර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු.3,712,556 ක ලැබිය යුතු ශේෂ 79 ක් සහ එකතුව රු.8,163,024 ක බැරකම් ශේෂ 96 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | කළමනාකරණ උපදෙස් අනුව කටයුතු කර කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 22 හි හිඟ විගණන ගාස්තු රු. 382,275 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ගෙවා නොතිබුණි | හිඟ විගණන ගාස්තු ගෙවීමට කටයුතු කරන බව. | හිඟ විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 දූෂ්‍ය අක්‍රමිකතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ගොවිජන බැංකුවට අයත්රු.2,213,000 කට ආසන්න මුදලක් අයථා පරිහරණය කිරීම, කූඨලේඛණ සකස් කිරීම සහ අධිකාරි බලය ඉක්මවා ගෙවීම් සිදු කිරීම යන චෝදනා හේතුවෙන් 2021 ජනවාරි 12 දින සිට ගොවි බැංකුවට | වවුචර් අඩුපාඩු නොමැතිව ඉදිරිපත් කළ යුතු බවට අදාල උපදෙස් ලබා දී ඇති බව. | විධිමත් පරිදි පරීක්ෂණ පවත්වා මුදල් රෙගුලාසි අනුව කටයුතු කර අදාළ මුදල් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුයුක්ත කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයාගේ වැඩ තහනම් කර තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් 2025 මැයි 22 විගණිත දින වන විටත් මුදල් රෙගුලාසි 104 අනුව පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර, මුදල් රෙගුලාසි 119 හි සඳහන් විධිවිධානයන්ගෙන් බැහැරව දිස්ත්‍රික් කාර්යාලය මඟින් එම නිලධාරින්ගේ මාසික වැටුපෙන් මාසිකව රු.28,000 බැගින් රු. 314,000 ක් වැඩ තහනම් කිරීමට පෙර අයකර ගෙන තිබුණි.එම වටිනාකම ගොවිජන බැංකුවට ලබාදිය යුතු වුවද,සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ එම වටිනාකම ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.එමෙන්ම අයථා ලෙස පරිහරණය කරන ලද මුදල ලෙස හඳුනාගෙන තිබුණ රු. 2,213,000 ක වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.එසේම, මේ සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 27 දිනැති NUE/A/AGG/නුඑ/2021/35(1), 2022 ඔක්තෝබර් 31 දිනැති අංක NUE/A/AGG/ නුඑ/2022/16(1) හා 2023 ජූලි 21 දිනැති CPCG/NE/B/AGG/NE/2023/23 දරන විගණන විමසුම් මඟින් කරුණු දක්වා තිබුණද, මේ වන තෙක් මෙම අයථා මුදල් පරිහරණය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) | රු. 100,000ට වැඩි කම්වු උපකරණ ගැනීමට ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් වෙත වවුචර්පත් ඉදිරිපත් කළ යුතු වුවත් ගිණිගත්හේන ගොවිජන සේවා කාරක සභාව රු 280,000 කට **"ශාප්"** වර්ගයේ පොටෝකොපි මැෂින් යන්ත්‍රයක් මිල දී ගැනීමේ දී රු. 82,000 ක් අත්තිකාරම් ගෙවීමක් ලෙසත් ඉතිරි මුදල රු 198,000 ක් ලෙසත් චෙක්පත් දෙකක් මඟින් ගෙවීම් සිදුකර තිබුණි.ගෙලිඔය පිහිටි ආයතනයකින් මිල දී ගත් **"ශාප්"** ඡායා පිටපත් යන්ත්‍රය නැවත සැපයුම්කරු වෙත ලබා දී ඒ වෙනුවට රු 280,000 .මුදලින් ලබාගෙන තිබුණි. ආයතනයේ දැනට භාවිතා කරන | ගෙලිඔය පිහිටි ආයතනයෙන් නව යන්ත්‍රයක් ලබාගත් බව හා කිසිදු ආකාරයක මූල්‍ය ගනුදෙණුවක් නොවුන බවත් එවැනි මිලදී ගැනීම් සම්බන්ධයෙන් ඉහළ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු අතර අවිධිමත් මිලදී ගැනීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | **“රිකෝ”** ඡායා පිටපත් යන්ත්‍රය වෙනුවෙන් 2024වර්ෂයේ දී වවුචර්පතක් ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.ඒ අනුව ගෙලිඔය සැපයුම්කරුගේ මුදල් ලබාගෙන එම මුදලින් **“රිකෝ”** ඡායාපිටපත් යන්ත්‍රයක් ආයතනයට මිලදීගෙන ඇතත් ඒ පිළිබඳ කිසිදු ප්‍රසම්පාදන ලියවිල්ලක් ආයතනය සතුව නොතිබුණි. | | |
| (ඇ) | නුවරඑළිය ගොවිජන සේවා කාරක සභාව සතුව තිබුණ උප පත්‍රිකා පොත් 03 ක් 2021 ජූනි මස 14 දින අස්ථානගතවී ඇති බවට මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර නිලධාරිනිය විසින් 2021 ජූනි 17 දින ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ලිපියක් මඟින් දැනුම් දි තිබුණු අතර, අස්ථානගතවූ රිසිට් පොත් මඟින් එකතු කර තිබුණ මුදල රු.1,437,903 ක් විය. මේ සම්බන්ධව වගකිවයුතු පාර්ශව හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග 2025 ජූනි 30 වන විටත් ගෙන නොතිබුණි. | පරීක්ෂණයක් සිදුවෙමින් පවතින බව. | විධිමත් පරීක්ෂණ සිදු කර වගකිව යුතු පාර්ශව හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | විදුලිපුර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ උත්සව අත්තිකාරම් ගෙවීමේ දී දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමුකරන ලද නිලධාරින් 04 දෙනෙකුගේ නම් සහ මුදල් භාරගත් නිලධාරීන් 04 දෙනෙකුගේ නම් අතර වෙනස්කම් නිරීක්ෂණය වූ අතර, මුදල් භාරගත් බවට අත්සන් කළ නිලධාරීන් 02නෙකුගේ අත්සන් කපාදමා තිබුණු අතර එම නිලධාරීන් දෙදෙනාගේ එක් අයෙකු 2023 වර්ෂයේ දී ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකු විය. | දෙදෙනෙකුගේ නම් නොමැති නිසා පසුව එම නම් වෙනුවට සිටින නිලධාරීන් දෙදෙනෙකු ඇතුලත් කර ඇති බව සහ අඩුපාඩු ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරන බව. | කාර්යාලයට අනුයුක්තව සේවය කරන බව තහවුරු කරගෙන ගෙවීම් කළ යුතු අතර ගෙවීම් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සහ සහකාර කොමසාරිස් වරුන්ගේ 2024 මැයි 03 සහ 04 දිනයන්හි දී පැවැත් වූ සමුළුවට ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, නුවරඑළිය ගේ 2024 අප්‍රේල් 22 දිනැති ලිපිය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභාවේ , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන සමුළුවේ වියදම් දැරීම සඳහා රු.945,000 ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන 12 කින් ද ගොවි සංවිධාන බල මණ්ඩල මගින් රු. 200,000 ක් ද | සත්භාවයෙන් රැස්වීම පවත්වාගෙන යාමට දුන් මුදලක් බව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් මත කටයුතු කර ඇති බව. | විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

පුද්ගලික සමාගම් මගින් රු. 378,000 ක් හා විදුලිපුර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් සහ ගොවීන්ගෙන් පෞද්ගලිකව රු. 30,000 ක් ලෙස මුළු වටිනාකම රු. 1,553,000 ක් රැස්කර සමුළු වියදම් දැරීමට ගෙවීම් කර තිබුණි.

## 3.6 වත්කම් කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මන්දාරම්නුවර ගොවිජන සේවා කාරක සභාව විසින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා උපයෝගී කර ගැනීමට 2021 සැප්තැම්බර් 27 දින රු. 165,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු ගොවි මිතුරා යන්ත්‍රය විගණිත දිනය වූ 2025 ජූලි 03 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කරන බව. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීමට කටයුතු කළ යුතු අතර යන්ත්‍රය උපයෝජනයට වැඩපිළිවෙලක් යෙදිය යුතුය |
| (ආ) | තාක්ෂණික නිලධාරී නිර්දේශය රහිතව මන්දාරම්නුවර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ යට ලී දැමීම සඳහා රු.193,750 ක් වියදම් දරා තිබුණි. | අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන ඇති බව. | විධිමත් නිර්දේශ යටතේ ඉදිකිරීම් සිදු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | පූඩළුඔය ගොවිජන කාරක සභාව විසින් කුලී පදනම මත ලබාදෙන ගරාජ් ගොඩනැගිල්ල හා බොජුන්හල් ගොඩනැගිල්ල රු.75,730 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී අලුත්වැඩියා කර තිබුණද, නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරි වර්ෂය තුළ දී ඒම ගොඩනැගිල්ල කුලි පදනම මත ලබා දිමට කටයුතු කරන බව. | වත්කම් උපයෝජනය කර ආදායම් උපයා ගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 30 ඡේදයේ 3 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන කාරක සභා 08 ක නියමිත දිනය ඉක්මවා මාස 01 ත් 03 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂවලදි නියමිත දිනට ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

**5. ගොවිජන බැංකු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වලපනේ ගොවිජන සේවා කාරක සභා වේ විශේෂ ව්‍යාපෘති ණය යටතේ 2016 වර්ෂයේ ගොවියෙකු වෙත නිදහස් කළ රු.500,000 ක ණය මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | හිඟ ණය ශේෂය අයකර ගැනීමත්, ණය ලබා දීම හා අයකරගෙන නොතිබීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර අදාළ ඉදිරි පියවර ගැනීමත් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 15 ක ගොවීන් 836 දෙනෙකුගේ රු.28,950,010 ක හිඟ ණය සම්බන්ධයෙන් ගොවිජන විනිශ්චය සභාව විසින් නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සේවා විනිශ්චය සභාවට ඉදිරිපත් කර හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 02 ක ගොවීන් 09 කට ලබා දී ඇති සිතමු ව්‍යවසාය ණය රු. 249,084 ක් ද ගොවිජන සේවා කාරක සභා 03 ක ගොවීන් 27 කට ලබා දී ඇති කෘෂි උපකරණ ණය රු.468,662 ක් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිටත් අයකරගෙන නොතිබුණි. | විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කර ඇති බව. | - එම - |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 04 ක ගොවීන් 43 දෙනෙකු මිය යාම හා ප්‍රදේශය හැරයාම හේතුවෙන් රු.1,136,522 ක ණය ගෙවීම පැහැර හැර තිබුණු අතර, එම ණය අයකරගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඇප කරුවනගෙන් අයකර ගැනිමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 04 ක ගොවීන් 133 දෙනෙකු වෙත තිකුත් කළ රු. 4,751,794 ක වටිනාකමකින් යුතු කෘෂි ණය වලින් කිසිදු වාරිකයක් 2024 දෙසැම්බර් 31දින වන විටත් අයකරගෙන නොතිබුණි. | ගොවිජන විනිශ්චය සභාව හා අධිකරණය වෙත යොමු කර ඇති බව. | - එම - |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 07 ක හිස් චෙක්පත් 34 ක අත්සන පමණක් යොදා අත රදවාගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත්. |

| | | | |
|---|---|---|---|
| | | | අභ්‍යන්තර මූල්‍ය පාලනය ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය. |
| (උ) | ගොවිජන සේවා කාරක සභා 08 ක ව්‍යාපෘති ණය නිකුත් කිරීමේ දී ව්‍යාපෘති වාර්තාව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර විසින් නිර්දේශ කර නොතිබුණි. | නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිර්දේශ ලබා දීමෙන් තොරව ණය නිකුත් කළ නිලධාරීන්ට පියවර ගත යුතුය.. |
| (ඌ) | ගොවිජන සේවා කාරක සභා 05 ක ව්‍යාපෘති ණය යටතේ සත්ත්ව පාලනය සඳහා ණය නිකුත් කිරීමේ දී අවස්ථා 42 ක දී පශු වෛද්‍ය නිර්දේශය ලබාගෙන නොතිබුණි. | නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන බව. | - එම - |
| (එ) | ගොවිජන සේවා කාරක සභා 22 ක රු. 25,000 ට වැඩි ගෙවීම් සඳහා රු. 25 ක මුද්දර ගාස්තුවක් අය කළ යුතු වුවත්, අවස්ථා 2408 ක ගෙවීම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.60,200 ක මුද්දර ගාස්තු අය කරගෙන නොතිබුණි. | මුද්දර බද්දෙන් නිදහස් කර ඇති ඇති බව. | මුද්දර බදු පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඒ) | කරල්ලියද්ද ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය මගින් මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයෙහි 2003 මාර්තු 12 දින ගොනු කරන ලද ,ණය ගොණු සඳහා රු.79,948 ක මුදලක් අධිකරණය වෙත ලැබී තිබුණද එම මුදල් බැංකුව වෙත විගණිත දිනය වන 2025 ජූනි 30 වන විටත් ලැබී නොතිබුණි. | දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර ඉදිරියේදී දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන බව . | අදාළ මුදල් කම්ටු වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |